# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1619/24 - 2009 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා - 2009.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී 9/96.

**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සමාජ සේවා සහ සමාජ සුබසාධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2006 ඔක්තෝබර් මස 17 වැනි දින අංක 1467/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2006 අංක 1 දරන ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග එහි 2 වැනි නියෝගයේ (1) වන ඡෙදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡෙදය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" (1) මේ නියෝගවල විධිවිධාන, ආබාධ සහිත තැනැත්තන් ප්‍රවේශ වන්නේ යම් ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන සහ පොදු සේවාවන්වලට ද, ඒ සියලු පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන සහ පොදු සේවාවන් සපයනු ලබන ස්ථානවලට අදාළවේ :

එසේ වුවද, දැනට පවතින සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන සහ පොදු සේවාවන් ලබාගත හැකි ස්ථාන මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භවීමෙන් වසර අටක් ඇතුළත, මේ නියෝගවලට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට කරනු ලැබිය යුතු ය.".

කේ. එන්. ඩග්ලස් දේවානන්ද,
සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍ය.

2009 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ,
සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශයේ දී ය.

10-244

1A - G 11730 — 335 (2009/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.